the Registrar of
Newspapers
CEYLON.

# බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත

පහත සඳහන් සංශෝධනයන් මෙහි ඇතුළත්ව ඇත

1938වෙ අංක 26 දරන ආඥාපනත

1957

ආණ්ඩුවේ නියමයෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

කොළඹ ආණ්ඩුවේ ග්‍රන්ථ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල: ශත 20 යි    තැපැල් ගාස්තුව: ශත 10 යි

# බල්ලන් ලියාපදිංචි කිරීම

## බල්ලන් ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැපයීම පිණිස පනවන ලද ආඥා පනතකි

**ලුහුඬු නාමය.**

1. මෙම ආඥා පනත බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥා පනත නමින් හැඳින්විය හැකි ය.

**පදාර්ථ.**

2. මෙම පනතෙහි—

"ආණ්ඩුවේ දිසාපති" යන්නට එවකට පළාතේ ආණ්ඩුවේ දිසාපති තැන ද මෙම පනතේ විධිවිධාන යටතේ යමක් කළ යුතු වූ හෝ කිරීමට වුවමනා වූ දිස්ත්‍රික්කයේ එවකට ආණ්ඩුවේ සහකාර දිසාපති තැන ද ඇතුළත් වෙත්.

"නිසි බල ධරයා" යන්නෙන් මහා නගර සභාවක් හෝ නගර සභාවක් හෝ සුළු නගර සභාවක් හෝ පිහිටුවා ඇති, නැතහොත්, මින් පසු එබන්දක් පිහිටුවනු ලබන නගරයක් ඇතුළත නම්, එකී මහා නගර සභාවේ නගරාධිපති තැන හෝ නගර සභාවෙහි හෝ සුළු නගර සභාවෙහි හෝ සභාපති තැන ද එබඳු නගරයක සීමාවලින් පිටත නම් ආණ්ඩුවේ දිසාපති තැන හෝ ඔහුගෙන් යථා පරිදි ලිපියකින් බලය ලත් තැනැත්තෙක් ද අදහස් කෙරෙති.

**පළාතේ නගර ආදිය මෙම පනත යටතට ගෙන ඒමට ඇමති වරයාට පිළිවන් බව.**

3. ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ඒ කාර්‍යය සඳහා ආඥාවක් පළ කිරීමෙන් යම් පළාතක්, දිස්ත්‍රික්කයක්, නගරයක් හෝ ස්ථානයක් මෙම පනත යටතට ගෙන ඒම ද එකී පළාතේ, දිස්ත්‍රික්කයේ, නගරයේ හෝ ස්ථානයේ සීමා මෙම පනතෙහි කාර්‍ය සඳහා විස්තර කිරීම ද තමා විසින් නිශ්චය කරනු ලැබූ අවස්ථාවක දී එකී ආඥාව සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම ද ඇමතිවරයාට නීත්‍යනුකූලව කළ හැකි වන්නේ ය.

**බල්ලන් ලියා පදිංචි කිරීම.**

4. යම් පළාතක්, දිස්ත්‍රික්කයක්, නගරයක් හෝ ස්ථානයක් මෙම පනත යටතට ගෙනෙනු ලැබූ කල්හි, මහා නගර සභාවක් හෝ නගර සභාවක් හෝ සුළු නගර සභාවක් හෝ පිහිටුවා ඇති නගරයක සීමා ඇතුළත තබා ගන්නා එක් බල්ලෙකුට රුපියල් පහට වැඩි නොවූ මුදලකින් ද එකී සීමාවලින් පිටත තබා ගන්නා එක් බල්ලෙකුට ශත විසි පහට වැඩි නොවූ මුදලකින් ද යුත් වාර්ෂික ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් නිසි බලධරයා විසින් අය කිරීම නීත්‍යනුකූල වන අතර, එසේ අය කිරීමට එකී නිසි බලධරයාට මෙයින් බලය ද දෙනු ලැබේ. එසේම එය එකතු කිරීම සහ අය කිරීම සඳහා ද ලියාපදිංචි කිරීමේ සහතික පත්‍ර නිකුත් කිරීම හා ප්‍රතික්ෂේප කිරීම සඳහා ද එකී සහතික පත්‍ර කොන්දේසි ඇතුළත් කොට නිකුත් කිරීම සඳහා ද යම් බල්ලෙකු සඳහා සහතික පත්‍රයක් දීම, ප්‍රතික්ෂේප කළ අවස්ථාවකදී හෝ සහතික පත්‍රයෙහි ඇතුළත් කොන්දේසි යම් බල්ලෙකු සඳහා ඉෂ්ට කරනු නොලැබූ අවස්ථාවක දී හෝ එකී බල්ලා පිළිබඳව යමක්

කිරීම හෝ ඒ විනාශ කිරීම හෝ සඳහා ද අවශ්‍ය වූ අතුරු ව්‍යවස්ථා කලින් කල සෑදීමට ද මෙයින් බලය දෙනු ලැබේ. තව ද, එබඳු පළාතක, දිස්ත්‍රික්කයක, නගරයක හෝ ස්ථානයක පදිංචිව සිටින්නා වූ ද තමාගේ අත් අඩංගුවේ හෝ භාරයේ බල්ලෙකු සිටින්නා වූ ද තැනැත්තෙකු විසින් එකී බල්ලා සඳහා ලියා පදිංචි කිරීමේ සහතිකයක් නිසි බලධරයාගෙන් ඉල්වා සිටිය යුතු ය. එවිට එබඳු එක් එක් බල්ලා සම්බන්ධයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් එකී තැනැත්තා වෙත නිකුත් කිරීමට නිසි බලධරයාට පිළිවන. එකී සහතිකයේ දිනට පසුව පැමිණෙන අවුරුද්දේ මාර්තු මස තිස් එක් වෙනි දින දක්වා එකී බල්ලා තමා වෙත තබා ගැනීමට එකී සහතිකයෙන් බලය ලැබෙන්නේ ය.

එසේ ද වුවත්, මහා නගර සභාවක් පිහිටුවනු ලැබූ නැතහොත් මින් මතු එබන්දක් පිහිටුවිය හැකි යම් නගරයක් ඇතුළත නම් මෙම වගන්තිය යටතේ නිසි බලධරයා වෙත පැවරුණ වාර්ෂික ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් අය කිරීමේ හා අවශ්‍ය වූ ව්‍යවස්ථා කලින් කල පැනවීමේ බලතල එකී මහා නගර සභාවේ නගරාධිපති තැන විසින් නොව, මහා නගර සභාව විසින් පාවිච්චි කළ යුතු ය.

තවද, කොළඹ මහා නගර සභාවේ සීමා ඇතුළත බැල්ලියන් පිළිබඳ රුපියල් හතකුත් ශත පනහකට වැඩි නොවන වාර්ෂික ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් අය කර ගැනීමට නිසි බලධරයාට පිළිවන.

*අතුරු ව්‍යවස්ථා ප්‍රසිද්ධ කිරීම.*

5. ඉහත දක්වුනු වගන්තිය යටතේ පනවනු ලැබූ සියලු ම, අතුරු ව්‍යවස්ථා පිළිවෙළින් ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කළ යුතු ය. තවද, එලෙස ප්‍රසිද්ධ කරනු ලැබූ දින සිට ඒවා මෙම පනතින් පනවනු ලැබූ ආකාරයට ම බලපවත් වන්නේ ය.

*අතුරු ව්‍යවස්ථා අනුමත කිරීම.*

6. 4 වෙනි වගන්තිය යටතේ පනවනු ලැබූ සියලු ම අතුරු ව්‍යවස්ථා එවකට පාර්ලිමේන්තුව රැස්වන කාලයකදී නම්, උත්තර මන්ත්‍රි මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රි මණ්ඩලය ඉදිරිපිට, එසේ ප්‍රසිද්ධ කිරීමෙන් පසු මාසයක් ඇතුළත දී තැබිය යුතු ය. තවද එකී ව්‍යවස්ථා පාර්ලිමේන්තුව රැස් නො වන කාලයකදී නම්, ඊළඟට පාර්ලිමේන්තු වාරය ආරම්භ කොට මාසයක් ඇතුළත දී එසේ තැබිය යුතු ය. එකී කොයි යම් අවස්ථාවකදී වුව ද, උත්තර මන්ත්‍රි මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රි මණ්ඩලයේ යටත් පිරිසෙසින් රැස්වීම් හතරක වැඩ සටහන්වල එය ඇතුළත්ව තිබිය යුතු ය. උත්තර මන්ත්‍රි මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රි මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු නො ලැබූ යම් අතුරු ව්‍යවස්ථාවක යම් බලයක් හෝ ප්‍රතිඵලයක් ඇති නො වන්නේ ය.

*ගෙයක පදිංචි කාරයා යටත් වන බව.*

7. යම් ගෙයක හෝ ස්ථානයක බල්ලෙකු හෝ බල්ලන් තබා ගනු ලැබූ අවස්ථාවක දී හෝ එබඳු බල්ලෙකුට හෝ බල්ලන්ට ජීවත්වීමට හෝ නැවතී සිටීමට ඉඩ හැරී අවස්ථාවකදී, එකී බල්ලා හෝ බල්ලන් සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුව, ගෙවීමට එකී ගෙයි හෝ ස්ථානයෙහි පදිංචිකාරයා යටත් වන්නේ ය. තවද එසේ ගෙවිය යුතු මුදල නො ගෙවා පැහැර හැරියොත්, ලියාපදිංචි නො කළ බල්ලන් තබා

ගාස්තු නැනැත්තා [illegible] දඬුවම්වලට ද යටත් වන්නේ ය. එකී පදිංචිකාරයා විසින් තමා පදිංචිව සිටින කොඨාසයේ මහෙස්ත්‍රාත් නැනට ඒත්තු යන පරිදි තමා එකී බල්ලාගේ හෝ බල්ලන්ගේ අයිතිකාරයා නොවන බව හෝ එකී බල්ලා හෝ බල්ලන් තමාගේ අත් අඩංගුවේ නැති බව සහ එකී ගෙයි හෝ ස්ථානයෙහි එකී බල්ලා හෝ බල්ලන් තබා සිටියේ නැතහොත් ජීවත්වීමට හෝ නැවතී සිටීමට ඉඩ හැර තිබුණේ තමාගේ අනුමතිය හෝ දැනුම නොමැතිව බව හෝ ඔප්පු කිරීමට හැකිවුවහොත්, කලින් සඳහන් දඬුවම්වලට ඔහු යටත් නො වන්නේ ය.

එසේ ද වුවත්, ගේය හෝ ස්ථානය වෙන ම වාසස්ථාන වශයෙන් හෝ නැවතුම් පොළවල් වශයෙන් හෝ අන් අන් දමකට හෝ කුලියට දෙනු ලැබ, ඒවායේ එක් කෙනෙකුට වැඩි ගණනක් පදිංචිකාරයින් සිටි කල්හි, එකී බල්ලා හෝ බල්ලන් තබා සිටි, නැතහොත් එකී බල්ලාට හෝ බල්ලන්ට ජීවත්වීමට හෝ නැවතී සිටීමට ඉඩ දුන් ස්ථානයේ එම කොටසෙහි අයිතිකාරයා එකී බල්ලා හෝ බල්ලන් වෙනුවෙන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව ගෙවීමට යටත් වන්නේ ය.

8. "බල්ලන්ගේ ලේඛන පොත" යයි කියනු ලබන පොතක් සෑම නිසි බලධරයකු විසින් ම තැබිය යුතු ය. එහි සියලු ම සහතික පත්‍ර නිකුත් කිරීම් ද ඒවායේ දින ද එකී සහතික පත්‍ර නිකුත් කරනු ලැබූ නැනැත්තාගේ නම සහ පදිංචි ස්ථානය ද සහතික පත්‍රයෙහි ඇතුළත් පරිදි බල්ලාගේ හෝ බල්ලන්ගේ විස්තර ද ලියාපදිංචි කොට තැබිය යුතු ය. බල්ලන්ගේ ලේඛන පො:

9. විකිණීමෙන් හෝ නැගි දීමෙන් හෝ යම් බල්ලෙකු ඔහුගේ අයිතිකාරයා විසින් වෙනත් නැනැත්තෙකුට අයිති කොට දුන් අවස්ථාවක දී, එම අවුරුද්ද ඇතුළත එකී බල්ලා ලියාපදිංචි කොට තිබී, ඒ සඳහා නිකුත් කරනු ලැබූ සහතිකය, එකී අයිතිකාරයා විසින් එම නැනැත්තාගේ වාසියට අත්සන් කොට දෙන ලදුව, එය තමා ළඟ තිබේ නම්, එකී බල්ලා සඳහා අලුත් සහතිකයක් ගැනීම අවශ්‍ය නො වන්නේ ය. බල්ලෙකු සතු කිරීමේ සහතිකයක් ගතයුතු බව

10. දඩාවතේ යන සියලු ම බල්ලන් ඇල්ලීමට සෑම නිසි බලධරයෙකු විසින් ම, විධිවිධාන සැලැස්විය යුතු ය. එබඳු බල්ලන් පිළිබඳව පහත දැක්වෙන පරිදි ක්‍රියා කළ යුතු ය. එනම්:— දඩාවතේ බල්ලන් ඇල්ලීම.

(1) එසේ අල්ලනු ලැබූ බල්ලා එසේ අල්ලා ගත් දින සිට නිසි බලධරයාට යෝග්‍ය යයි හැඟෙතොත්, දවස් තුනකට අඩු නොවන කාලයක් සුදුසු තැනක තැබිය යුතු ය. අයිතිකාරයා හෝ බල්ලා භාරව සිටි නැනැත්තා දැනගත හැකි වූ විට, බල්ලා අල්ලා නතර කොට තිබෙන බව එකී නිසි බලධරයා විසින් ඔවුන්ගෙන් කෙනෙකුට දැන්විය යුතු ය. තවද, එකී ඇල්ලීම හා නතර කිරීම සම්බන්ධයෙන් [illegible] ලියාපදිංචි කරනු නො

ලැබීමෙන් පසු, මෙම පනතේ යම්කිසි විධිවිධානයක් කඩ කිරීම සඳහා යම් දඩුවම් මුදලක් අය කර ගැනීමේ බලයට හානියක් නො වන පරිදි, එකී බල්ලා, දනුම් දුන් තැනැත්තාට හෝ ඔහුගේ නියෝජිත තැනට භාර දිය යුතු ය;

(2) ඉහත සඳහන් දැන්වීම භාර කිරීමෙන් පසු, දවස් දෙකක් ඇතුළත එසේ අල්ලා නතර කරනු ලැබූ බල්ලා සම්බන්ධයෙන් අයිතිවාසිකම් කියා නො සිටියහොත්, නැතහොත් අයිතිකාරයෙකු හෝ බල්ලා භාරයේ සිටි වෙනත් කෙනෙකු හෝ ගැන දැන ගැනීමට නො හැකි අවස්ථාවක දී නම් එකී ඇල්ලීමෙන් පසු නිසි බලධරයාට යෝග්‍ය යයි වැටහෙන පරිදි තුන් දවසකට අඩු නො වන කාලයක් ඇතුළත දී ද එකී ඇල්ලීම සහ නතර කිරීම සම්බන්ධයෙන් දරන්ට වූ සාධාරණ වියදම් හා ඉහත කී ලෙස ලියාපදිංචි කිරීමේ ගාස්තුව ගෙවිය යුතු වුවහොත් එකී ගාස්තුව නො ගෙවන ලද නම් එකී බල්ලා විනාශ කර වීමට හෝ තමාට සුදුසු යයි හැඟෙන අන් කිසිවක් කිරීමට හෝ නිසි බලධරයාට බලය ඇති වන්නේ ය.

දඩුවම.

11. (1) මෙම පනත ක්‍රියාවේ යෙදීමෙන් පසු සෑම අවුරුද්දක ම මාර්තු මාසයේ තිස් එක් වෙනිද සිට සහ ඉන් පසුව මෙම පනත යටතට ගෙනෙනු ලැබූ යම් පළාතක, දිස්ත්‍රික්කයක, නගරයක හෝ ස්ථානයක මෙම පනතෙහි විධිවිධාන ප්‍රකාර යථා පරිදි ලියාපදිංචි කරනු නො ලැබූ යම් බල්ලෙකු භාරව හෝ අත් අඩංගුවේ තබා හෝ ඇති යම් තැනැත්තෙක් වරදකට යටත් වන අතර එසේ වරදකාරයා කිරීමෙහිදී රුපියල් විස්සකට වැඩි නො වන දඩයකට ද යටත් වන්නේ ය. තවද, එකී මුදල නො ගෙවන ලද නම්, සති දෙකකට වැඩි නොවන කාලයකට වැඩ නැතිව බන්ධනාගාර ගත කිරීමකට ද ඔහු යටත් වන්නේ ය. එසේ ම, එකී බල්ලා සඳහා වහාම සහතික පත්‍රයක් ඉල්ලන ලෙස මහේස්ත්‍රාත් තැන විසින් එකී තැනැත්තාට වැඩි දුරටත් නියම කළ යුතු ය. එවිට එකී තැනැත්තා විසින් ලියාපදිංචි කිරීමේ නියම ගාස්තුව ගෙවීමෙන් පසු ඔහු වෙත එබඳු සහතිකයක් නිකුත් කිරීමට නිසි බලධරයාට පිළිවන. එකී සහතිකයෙහි සඳහන් දිනට පසුව පැමිණෙන අවුරුද්දේ මාර්තු මස තිස් එක්වෙනි දින දක්වා එම සහතිකය වලංගු වන්නේ ය. තවද එකී නියමයෙන් පසුව ද සහතිකයක් සඳහා ඉල්ලීමක් නොකොට නැතහොත් ඉල්ලීමක් කොට එය ප්‍රතික්ෂේප කරනු ලැබ, යම් තැනැත්තෙක් බල්ලෙකු තබා ගෙන සිටියොත්, දෙවෙනි වරට සහ ඊට පසු ද කරනු ලබන වරද වලට නියමිත දඩුවමට අතිරේකව එසේ සහතිකයක් නොමැතිව, බල්ලෙකු තබා ගන්නා එක් එක් දවසට ශත පනහකට වැඩි නොවන මුදලක්ද ඔහු විසින් ගෙවිය යුතු ය.

(2) 4 වෙනි වගන්තියේ විධිවිධාන යටතේ පනවනු ලැබූ යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කරන තැනැත්තෙක් වරදකාරයා වීමෙහි දී රුපියල් විස්සකට වැඩි නොවන දඩයකට ද එය නො ගෙවුවහොත්, සති දෙකකට වැඩි නොවන කාලයකට වැඩ නැතිව බන්ධනාගාර ගත කිරීමකට ද යටත් වන්නේ ය.

(3) මෙම පනත යටතේ දඬුවම් කළ හැකි යම් වරදක් විභාග කිරීමට භාර ගැන්ම සඳහා නම් කරනු ලැබූ ගම්බද උසාවියකට බලය දීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි කලින් කල ආඥාවක් පළ කිරීමෙන් ඇමතිවරයාට කළ හැකි ය. එබඳු අවස්ථාවක දී එකී ගම්බද උසාවියට මෙම පනත යටතේ මහෙස්ත්‍රාත් කෙනෙකුට ඇති අධිකරණ බලය සහ බලතල ම ඇත්තේ ය.

සහතිකය ඉදිරිපත් කිරීම.

12. තමාගේ ස්වාමිත්වයෙහි බල්ලෙකු තබා ගෙන සිටින සෑම කෙනෙක් ම, මහෙස්ත්‍රාත් කෙනෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ සාම නිලධාරියෙකු විසින් හෝ නිසි බලධරයකු විසින් හෝ ඔහු විසින් යථා පරිදි ලියවිල්ලකින් බලය දෙනු ලැබූ වෙනත් තැනැත්තෙකු විසින් හෝ ඉල්ලූ විටක, එකී බල්ලා සඳහා ගනු ලැබූ සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. එකී බල්ලා යථා පරිදි ලියාපදිංචි කොට තිබිය දී, එකී සහතිකය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කළ හොත් ඒ තැනැත්තා රුපියල් පහකට වැඩි නොවන දඩයකට යටත් වන්නේ ය.

පැහැර හැරීම ඕනෑකමින් ම කරන ලද්දක් නුවුවහොත් දඩයක් නියම නොකළ යුතු බව.

13. මෙම පනතෙහි විධිවිධාන හෝ පනත යටතේ පනවනු ලැබූ යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ ඉෂ්ට නොකළ තැනැත්තා එකී ඉෂ්ට නො කිරීමට ඕනෑ කමින් ම, වරදකරුවකු නුවූ බව යම් අවස්ථාවක දී මහෙස්ත්‍රාත් තැනට ඒත්තු යන පරිදි පෙනී ගියොත් ඔහු විසින් ඒ සඳහා දඩයක් නියම නො කළ යුතු ය.

එසේ වුවත්, තමාගේ ස්වාමිත්වයේ හෝ භාරයේ සිටින බල්ලා හෝ බල්ලන් සඳහා සහතික පත්‍රයක් ඉල්ලුම් කිරීමට හෝ අන් අන්දමකින් මෙම පනතෙහි විධිවිධාන ඉෂ්ට කිරීමට හෝ එකී මහෙස්ත්‍රාත් තැන විසින් එම තැනැත්තාට වහාම නියම කළ යුතු ය. එකී නියමය එම තැනැත්තා විසින් වහාම ඉෂ්ට කළ යුතු ය.

මහා නගර සභා, නගර සභා හා සුළු නගර සභා වලට ගාස්තු අයකර ගැනීමට බලය ඇති බව.

14. මෙම පනතෙහි විධිවිධාන යටතේ සහතික පත්‍ර සඳහා ගෙවනු ලැබූ මුදල් ද යම් මහා නගරයක පදිංචිකාරයන්ගෙන් මෙම පනතෙහි විධිවිධාන යටතේ අය කර ගනු ලැබූ සියලු ම දඬුවම් මුදල් ද එකී මහා නගරයේ මහා නගර සභාව විසින්, මහා නගර සභා අරමුදල සඳහා අය කර ගත යුතු ය. එසේම, යම් නගර සභාවක හෝ සුළු නගර සභාවක පදිංචිකාරයන් විසින් ගෙවනු ලැබූ නැතහොත් ඔවුන් ගෙන් අය කර ගනු ලැබූ, එබඳු මුදල් සහ දඬුවම් මුදල් එකී නගරයේ ප්‍රාදේශික අරමුදල සඳහා එම නගර සභාව හෝ සුළු නගර සභාව හෝ විසින් අය කර ගත යුතු ය.

නඩු විභාග කිරීම සඳහා මහා නගර මහේස්ත්‍රාත් තැනට දී ඇති බලය.

15. මහා නගරයක් ඇතුළත මෙම පනත යටතේ කරනු ලැබූ යම් වරදක් හෝ මෙම පනත යටතේ නීත්‍යනුකූලව පනවනු ලැබූ යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීමක් හෝ යම් නගරයක මහා නගර මහෙස්ත්‍රාත් තැන විසින් අසා විභාග කොට විසඳිය යුතු ය. තවද, නීතියෙන් බලය ලත් ප්‍රකාර දඬුවම් දීමට ද, එකී මහෙස්ත්‍රාත් තැනට අධිකරණ බලය ඇත්තේ ය.